# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1659/8 - 2010 ජුනි 22 වැනි අඟහරුවාදා - 2010.06.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තිය යටතේ කරනු ලබන නිවේදනය

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(2) වගන්තියෙහි සඳහන් විධිවිධානවලට අනුකූලව, පත්කරන්නට යෙදුණු විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පහත චෝදනාවල සඳහන් වැරදි ක්‍රියා හේතුකොටගෙන කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී ඉහත කී ප්‍රඥප්තියෙහි 2 (1) වගන්තියෙහි සඳහන් වැරදි ක්‍රියා සිදුකර ඇත් ද යන්න පරීක්ෂා කරන ලදී.

එසේ පරීක්ෂා කරන ලද චෝදනා නම්:-

*(අ)* කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2007.04.01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනක සිට ඉදිරියට වසර දෙකක කාලයක් සඳහා කොටුව නාගරික කොට්ඨාසය සහ අංක 05 දරන දිසා කාර්යාල බල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කොන්ත්‍රාත්තුව දෙහිවල, කොහුවල, දුටුගැමුණු මාවතෙහි 96/ඒ ලිපිනයෙහි "කෙයාර් ක්ලීන් පෞද්ගලික සමාගම" වෙත ලබාදීමට අදාළව ටෙන්ඩර් කැඳවීමකින් තොරව හා/හෝ ගිවිසුම සහා අනුමත කිරීමකින් තොරව ගිවිසුම්ගත වීමට ක්‍රියාකර මහ නගර සභා ආඥාපනතේ 229 (1) (ආ) හා/හෝ 229 (1) (ඇ) වගන්තිය/වගන්ති උල්ලංඝණය කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

*(ආ)* කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2007.07.01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනක සිට ඉදිරියට වසර දෙකක කාලයක් සඳහා අංක 01 දරන දිසා කාර්යාල බල ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කොන්ත්‍රාත්තුව දෙහිවල, කොහුවල, දුටුගැමුණු මාවතෙහි 96ඒ ලිපිනයෙහි "කෙයාර් ක්ලීන් පෞද්ගලික සමාගම" වෙත ලබාදීමට අදාළව ටෙන්ඩර් කැඳවීමකින් තොරව හා/හෝ ගිවිසුම සහා අනුමත කිරීමකින් තොරව ගිවිසුම්ගත වීමට ක්‍රියාකර මහ නගර සභා ආඥාපනතේ 229(1) (ආ) හා/හෝ 229 (1)(ඇ) වගන්තිය/වගන්ති උල්ලංඝණය කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1)(අ) හා/හෝ 2(1)(ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

1A - PG 001153—430 (2010/06)

(ඇ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2007.07.01 වැනි දින සිට හෝ ඊට ආසන්න දිනක සිට ඉදිරියට වසර දෙකක කාලයක් සඳහා කොටුව සහ පිටකොටුව නාගරික කොට්ඨාසය හැර "දිසා අංක 02 ඒ දිසා කාර්යාල බල ප්‍රදේශයේ ඉතිරි කොටසේ" ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කොන්ත්‍රාත්තුව කොළඹ 05, කිරුළ පාරේ, අංක 141 ලිපිනයෙහි "අබාන්ස් එන්වයර්මන්ට් පෞද්ගලික සමාගම" වෙත ලබාදීමට අදාළව ටෙන්ඩර් කැඳවීමකින් තොරව හා/හෝ ගිවිසුම සහා අනුමත කිරීමකින් තොරව ගිවිසුම්ගත වීමට ක්‍රියාකර මහ නගර සභා ආඥාපනතේ 229(1)(ආ) හා/හෝ 229(1) (ඇ) වගන්තිය/වගන්ති උල්ලංඝණය කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1)(අ) හා/හෝ 2(1)(ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම ;

(ඈ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2006.11.24 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී "නාගරික මන්ත්‍රීවරුන් වෙත" බෙදාදීම සඳහා ඌෂා වර්ගයේ මහන මැෂින් 1590ක් මිලදීගෙන ඒ වෙනුවෙන් රුපියල් 2,05,90,500.00 හෝ ඊට ආසන්න මුදලක් වියදම් කිරීමට යෝජනා සම්මත කර ටෙලිසොනික් ඉන්ටර්නැෂනල් ආයතනය සමග 2006 නොවැම්බර් 29 දින හෝ ඊට ආසන්න දිනයක දී ගිවිසුමට ඇතුළත් වීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1)(අ) වගන්තියේ සඳහන් වරදක් සිදු කිරීම ;

(ඉ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2006.12.22 වැනි දින හෝ ඊට ආසන්න කාලසීමාවක දී ඇස්බැස්ටස් සෙවිලි තහඩු මිලදී ගැනීමේ දී පිරිවිතරයන්ට අනුගත බවට ඇගයීම් කමිටුව විසින් ද නිර්දේශ කරන ලද ශ්‍රී රැම්කෝ පුද්ගලික ආයතනය විසින් ඉදිරිපත් කර ඇති තහඩුවක වටිනාකම රුපියල් 746.23ක් වන ඇස්බැස්ටස් සෙවිලි තහඩු මිල දී ගැනීම ප්‍රතික්ෂේප කර චන්ද්‍ර ශ්‍රී හාඩ්වෙයාර් ස්ටෝර්ස් විසින් ඉදිරිපත් කරන ලද තහඩුවක වටිනාකම රුපියල් 968.30ක් වන ඇස්බැස්ටස් සෙවිලි තහඩු මිලදී ගැනීමට සභා සම්මත කර, ඒ අනුව කටයුතු කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (1)(අ) වගන්තියේ සඳහන් වරදක් සිදු කිරීම ;

(ඊ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2006.12.22 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී "නාගරික මන්ත්‍රීවරුන්" හට ලබාදීම සඳහා ඇස්බැස්ටස් ෂීට් 10,211 ක් මිලදී ගැනීමට යෝජනා සම්මත කර මිලදී ගැනීමට සලස්වා ඒ වෙනුවෙන් මහ නගර සභා ආඥාපනතේ 188 (1) වගන්තියට අනුගත නොවන පරිදි රුපියල් 85,97,662.00 ක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීම් කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම ;

(උ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2006.12.22 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී "නාගරික මන්ත්‍රීවරුන්" හට ලබාදීම සඳහා ගැල්වනයිස් තහඩු 5682 ක් මිලදී ගැනීමට යෝජනා සම්මත කර මිලදී ගැනීමට සලස්වා ඒ වෙනුවෙන් මහ නගර සභා ආඥාපනතේ 188(1) වගන්තියට අනුගත නොවන පරිදි රුපියල් 52,27,440.00 ක් හෝ ඊට ආසන්න මුදලක් ගෙවීම් කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2 (1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම ;

(ඌ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2007.05.29 වැනි දින හෝ ඊට ආසන්න දිනයක දී ටෙන්ඩර් ක්‍රියා පටිපාටියෙන් පරිබාහිරව මිලදී ගන්නා ලද පිසූ බත් පාර්සල් 1,02,174 ක් හෝ ඊට ආසන්න ප්‍රමාණයක් නාගරික සභිකවරුන් මගින් මිලදී ගැනීමට සලස්වා ඒ වෙනුවෙන් රුපියල් හැටහතර ලක්ෂ පනස් හතර දහස් හත්සිය විසිපහක් (රු.64,54,725.00) ක් හෝ ඊට ආසන්න මුදලක් මහ නගර සභා පොදු අරමුදලින් වියදම් දැරීමට සභා සම්මත කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) වගන්තියේ සඳහන් වරදක් සිදු කිරීම ;

(එ) කොළඹ මහ නගර සභාව විසින් කටයුතු කිරීමේ දී 2006.05.01 වැනි දින සිට 2007.05.01 වැනි දින දක්වා කාල සීමාවක දී කොළඹ මහ නගර සභාව සතු විහාර මහ දේවි උද්‍යානය පිහිටි භූමිය තුල සතුටු උයන පවත්වාගෙන යමින් එයින් උපචිත රුපියල් 2,89,19,640.81 ක් හෝ ඊට ආසන්න මුදලක් මහ නගර සභා පොදු අරමුදලට බැර කිරීමට කටයුතු නොකිරීමෙන් මහ නගර සභා ආඥාපනතේ 185(2) (ඉ) වගන්තිය උල්ලංඝනය කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම.

කොළඹ මහ නගර සභාවට එරෙහි ඉහත සඳහන් චෝදනා පරීක්ෂා කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු ආචාර්ය චන්ද්‍රදාස නානායක්කාර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණ වාර්තාවට අනුව ඉහත සඳහන් *අ, ආ, ඇ, ඈ, ඊ, උ* යන චෝදනාවලට කොළඹ මහ නගර සභාව වැරදිකරු බවටත්, *ඉ, ඌ, එ* යන චෝදනාවලට කොළඹ මහ නගර සභාව නිවැරදිකරු බවටත් නිගමනය කර ඇත.

තව ද, බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් ඉහත කී බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුව පත්කරන්නට යෙදුණු විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමාගෙන් සැදුම්ලත් ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉහත *අ, ආ, ඇ, ඈ, ඊ, උ* යන චෝදනා සහ පහත සඳහන් අතිරේක චෝදනාව සම්බන්ධයෙන් කොළඹ මහ නගර සභාවේ නගරාධිපති, උප නගරාධිපති හා සභිකවරුන්ගේ ඒක පුද්ගල හා සාමූහිකව වගකීම පරීක්ෂා කරන ලදී.

ඉහත කී අතිරේක චෝදනාව නම්,

"2006.05.01 දින සිට 2007.05.01 දින දක්වා කාල සීමාවකදී කොළඹ මහ නගර සභාව සතු විහාර මහා දේවී උද්‍යානය පිහිටි භූමිය තුල සතුටු උයන පවත්වාගෙන යමින් එයින් උපචිත රුපියල් 1,55,55,440.81 (එක් කෝටි පනස් පන් ලක්ෂ පනස්පන් දහස් හාරසීය හතලිහයි ශත අසූ එකක්) හෝ ඊට ආසන්න මුදලක් මහ නගර සභා පොදු අරමුදලට බැර කිරීමට කටයුතු නොකිරීමෙන් මහ නගර සභා ආඥාපනතේ 185(2) (ඉ) වගන්තිය උල්ලංඝනය කිරීමෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනයවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2(1) (අ) හා/හෝ 2(1) (ඇ) වගන්තිය/වගන්තිවල සඳහන් වරද/වරදවල් සිදු කිරීම"

ඊට අදාළව ඉදිරිපත් කරන ලද විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු බී. එල්. කේ. විමලචන්ද්‍ර මැතිතුමාගෙන් සැදුම්ලත් පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව මගින් ඉහත සඳහන් *අ, ආ, ඇ, ඈ, ඊ, උ* යන චෝදනා සහ ඉහත සඳහන් අතිරේක චෝදනාවට අදාළව කොළඹ මහ නගර සභාවේ නගරාධිපති, උප නගරාධිපති සහ සභිකවරුන් සම්බන්ධයෙන් ඒක පුද්ගල හා සාමූහික වගකීම පිළිබඳ නිගමන ඉදිරිපත් කරන ලදී.

අදාළ චෝදනා සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති සාක්ෂි සහ ඒක පුද්ගල පරීක්ෂණ කොමිෂන් සභා විසින් ඉදිරිපත් කර ඇති නිගමන පිළිබඳ මනාලෙස අධ්‍යයනය කිරීමෙන් පසු මම ඒ සම්බන්ධයෙන් ස්වාධීන නිගමනයන්වලට එළඹෙමි. ඒ අනුව කොළඹ මහ නගර සභාව ඉහත සඳහන් *අ, ආ, ඇ, ඈ. ඊ. උ* සහ ඉහත කී අතිරේක චෝදනාවට වරදකරු බවට මම නිගමනය කරමි.

ඒ අනුව කොළඹ මහ නගර සභාව කටයුතු කිරීමේ දී ඉහත සඳහන් *අ, ආ, ඇ, ඈ, ඊ, උ* යන චෝදනාවල සහ ඉහත කී අතිරේක චෝදනාවෙහි සඳහන් වැරදි ක්‍රියා සිදු කිරීම හේතුකොටගෙන බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (1) (අ) හා 2 (1) (ඇ) වගන්තිවල සඳහන් වැරදි ක්‍රියා සිදු කර ඇති බවට මම සෑහීමකට පත් වෙමි.

එසේ සෑහීමකට පත්වීමෙන් පසු බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1991 අංක 04 දරන පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීමේ බලය පිළිබඳ ප්‍රඥප්තියේ 2 (i) (iii) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2010 ක් වූ ජුනි මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ මහ නගර සභාව විසුරුවා හරිමි.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2010 ජුනි මස 21 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

07-220

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.